# 2022 දෙසැම්බර් මස පැවැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

## තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

**දිනය** - **2022.12.05**
**වේලාව** - **පෙ.ව. 10.00**
**ස්ථානය** - **තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව**

**පැමිණීම** -

| | | |
|---|---|---|
| I. | ඩබ්ලිව්.ජී. උපුල් මහතා | - ගරු සභාපති |
| II. | විදානගමගේ සුදත් මහතා | - ගරු උප සභාපති |
| III. | ඩබ්.කේ. ටෂිත සමිල මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | ඒ.පී. ධම්මික මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | ආර්.රජිත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VI. | චතුමිණි දිල්ශානි විජේනායක මෙනවිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VII. | ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VIII. | ආර්.කේ.එම්. රෝහිත මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IX. | පී.කේ. ආරියසේන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| X. | එන්.ජී. සරත් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XI. | වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XII. | චමින්ද ඩයස් වන්නිගේ මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIII. | ජී.එච්.ජී. නීටා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIV. | වැල්ලගේ ජීවානි මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XV. | ඒ.ඩබ්. නන්දා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVI. | පී.එල්. වාලි ගුණරත්න මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |

**නොපැමිණීම** -

| | | |
|---|---|---|
| I. | කේ.එච්. ගාමිණී මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| II. | එල්.එච්. කුමුදු සුජීව ප්‍රියන්ත මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| III. | හර්ෂ උදය කුමාර ජයවීර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | කපිල ඉන්ද්‍රජිත් ශ්‍රීවර්ධන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | ඩබ්.කේ. සිසිර කුමාර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |

ප්‍රථමයෙන්ම සියලුම දෙනා පංචසීලය සමාදන් වීමෙන් අනතුරුව, රට වෙනුවෙන් දිවිපිදූ විරෝධාර රණවිරුවන්ට, ප්‍රාදේශීය සභාවේ ධූර කාලය දරා, මේ වන විට මිය ගොස් ඇති බුද්ධදාස ජයසූරිය මහතා ඇතුළු ගරු සභාපතිවරුන්ට, ගරු උප සභාපති ලෙස සිට මිය ගොස් ඇති ඩබ්.කේ. ප්‍රේමදාස මහතා හා අප සභාව නියෝජනය කළ ගරු සභික, එච්.ජේ.කේ.ජී. විජේරාම මහතාත්, ගරු සභිකවරුන් ඇතුළුව මියගිය සියලුම දෙනාට උපහාර දක්වමින්, විනාඩි දෙකක නිෂ්ශබ්දතාවය පළ කරන ලදී.

ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් 2022 වර්ෂයේ දෙසැම්බර් මස විශේෂ මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්, ලේකම්තුමිය, මාධ්‍යවේදී රංජිත් ඩයමන් සහ ඒ.ඒ. ප්‍රේමසිරි මහතා ඇතුළු පිරිස පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදී.

2023 වර්ෂයේ අයවැය සම්මත කර ගැනීම සඳහා අද දින විශේෂිත සභාව කැඳවීමට හේතු වූ බවත්, ගරු සභිකයින් අද දින අයවැය සම්මත කර දීම සඳහා පැමිණ, ප්‍රාදේශීය සභාවේ උන්නතිය වෙනුවෙන් සිදු කරන්නාවූ කැපකිරීමට ගරු උප සභාපතිතුමා ඇතුළු සියලුම ගරු ප්‍රාදේශීය සභා සභිකයින් වෙත තම ස්තුතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදී.

අප පාලන කාලය තුළ 2019 වර්ෂයේ සිට අයවැය සම්මත කර ගනිමින්, තිස්සමහාරාම ජනතාවට වඩාත් ඵලදායි සේවයක් ඉටු කිරීමට කටයුතු කර ඇත. මෙම අයවැය සම්මත කිරීමට පෙර ආයතනයේ අයවැය සකස් කිරීම සම්බන්ධ සාකච්ඡා, කමිටු, අයවැය කෙටුම්පත සාකච්ඡා කිරීම ආදිය සිදු කර, අද දින අයවැය සම්මත කර ගැනීමට ඉදිරිපත් කළ බවත් සඳහන් කරන ලදී.

ප්‍රාදේශීය සභාවක් ලෙස ජනතාව වෙනුවෙන් මෙතෙක් සිදු කරන්නාවූ කටයුතු වලදී ගරු උප සභාපතිතුමා ඇතුළු සියලුම ගරු සභිකයින් ලබා දුන් සහායට ස්තුතිය පුද කරන ලදී. පක්ෂ විපක්ෂ සියලුම ගරු සභිකයින් ප්‍රාදේශීය සභාවේ කාර්යයන් ඉටු කර ගැනීම සඳහා ලබා දෙන සහායටත් නැවත් වරක් සියලුම දෙනාට ස්තුතිය පුද කරන ලදී.

එසේම ගරු මහා සභාවක් ලෙස අප විසින් ගනු ලබන තීන්දු තීරණ ක්‍රියාවට නැංවීමේදී ලේකම් ඇතුළු කාර්ය මණ්ඩල නිලධාරී මහත්ම මහත්මීන් ලබා දුන් සහායත් මේ අවස්ථාවේ සිහිපත් කරන අතර, ඒ වෙනුවෙන් එම සියලුම දෙනාට ස්තුතිය පුද කරන ලදී.

තවද, අප සභාව සඳහා සහභාගී වන ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන් වන රංජිත් ඩයමන් මහතා, ඒ.ඒ. ප්‍රේමසිරි මහතා යන දෙපලට අප විසින් ආරාධනා කරන සෑම අවස්ථාවකම පෙනී සිට තිස්සමහාරාමය වෙනුවෙන් ස්වාධීනව කටයුතු කිරීම සම්බන්ධයෙන් එතුමන් දෙපලටත් ස්තුතිය පුද කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් 2023 වර්ෂයේ අයවැය පණිවිඩය සභා ගත කරන ලදී.

**(ආ) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදනය -**

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන -**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

- **ගරු සභාපති විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා**

01. 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛනය සම්මත කර ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා

2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය මගින් සභාවට හොඳ ආදායම් තත්ත්වයක් ගොඩනංවා ගෙන, ජනතාවාදි සේවාවන් රැසක් සිදු කිරීමට බලාපොරොත්තු වේ. 2019 වර්ෂයේ සිට රට තුළ ඇති වූ සහරාන්ගේ බෝම්බ ප්‍රහාරය, කොරෝනා වසංගත තත්ත්වය සේම රට තුළ උද්ගත වූ ආර්ථික අර්බුධකාරී තත්ත්වයන් නිසා පසුගිය වර්ෂයන්වල සිතූ පරිදි සභාවෙන් ඉටු විය යුතු සේවාවන් ලබා දීමට නොහැකි වුවත්, 2023 වර්ෂයේ ප්‍රසස්ථ මට්ටමකින් ජනතා සේවයක් ඉටු කිරීමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන ලදී.

එසේම පසුගිය වර්ෂයන්වල බාධා හමුවේ වුවත් හැකි පමණින් ජනතා සේවයක් ඉටු කිරීමට කටයුතු කළ අතර, එකී සෑම සේවාවක්ම ලබා දීමේදී ගරු උප සභාපතිතුමා, ගරු සභිකයින් සහ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය ලබා දුන් සහයෝගයට ස්තුතිය පුද කරන ලදී.

2023 වසරේ සිට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට නව ආදායම් මාර්ගයක් ලෙස තිස්සමහාරාම වැව ආශ්‍රිත බෝට්ටු සවාරිය සඳහා අංගනයක් සකස් කර, එය නියාමනය කර ආදායම් ලබා ගැනීමට හැකි වන පරිදි වැඩපිළිවෙලක් සකස් කිරීමට අපේක්ෂා කරන බව දන්වා සිටින ලදී.

එසේම තිස්සමහාරාම උසාවියට පැමිණෙන වාහන, යතුරු පැදි එම මාර්ගය දෙපස නතර කර තිබීම නිසා ඒ අවට ජනතාවට දැඩි අපහසුතාවයකට පත් වීමට සිදුව ඇති බැවින්, එකී අපහසුතාවයන් වළක්වා ගැනීම සඳහාත්, ප්‍රාදේශීය සභාවට නව ආදායම් මාර්ගයක් ලෙසත් පරණ උසාවි ගොඩනැගිල්ල ඉවත් කර ඇති ස්ථානයේ රථවාහන නැවතුම්පොළ ඇතුළුව උසාවියට පැමිණෙන ජනතාවගේ සියලුම පහසුකම් සපුරා ගත හැකි වන පරිදි ස්ථානයක් සකස් කිරීමේ වැඩපිළිවෙලක් සකස් කිරීමට තීරණය කර ඇති බැවින්, මෙමගින්ද සභාවට ආදායමක් ලබා ගත හැකි වන බව ප්‍රකාශ කරන ලදී. එසේම මෙම අවශ්‍යතාවය එම කොට්ඨාසය භාර ගරු සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා ද පෙන්වා දුන් බව මෙම අවස්ථාවේ සිහිපත් කරන ලදී.

තවද, පරණ උසාවිය ඉදිරිපිට උසාවියට පැමිණෙන ජනතාවට පොදු සේවා සපයන ස්ථානය සකස් කිරීමත් සමඟ එම ප්‍රදේශයේ ස්වයං රැකියාවල නියුතුවන්ට ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස ඒ අසල හෙල බොජුන් හලක් ඉදි කිරීමට ද අදහස් කර ඇති බැවින්, එම ව්‍යාපෘතිය මගින්ද සභාවට ආදායමක් ලබා ගත හැකි බව සඳහන් කරන ලදී.

තිස්සමහාරාම බල ප්‍රදේශය තුළ වැඩි ජනගහනයක් සිටින රන්මිණිතැන්න ප්‍රදේශයේ කුඩා දරුවන් පෙර පාසල් අධ්‍යාපනය සඳහා දුර බැර ගෙවා ගෙන තිස්සමහාරාමය, දෙබරවැව වැනි ප්‍රදේශය වෙත පැමිණෙන නිසා, ගරු උප සභාපතිතුමා විසින් යෝජනාවක් ගෙන එමින්, ඒ සඳහා දැඩි මැදිහත්වීමක් ලබා දී රන්මිණිතැන්න ප්‍රදේශයට නව පෙර පාසලක් ඉදිකිරීම සඳහා ඉඩමක් වෙන් කර ලබා දීමෙන්, මේ වන විට එම පෙර පාසලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට හැකි වී ඇත. ඒ වෙනුවෙන් ගරු උප සභාපතිතුමා වෙත ස්තුතිය පුද කරන අතර, පෙර පාසල ඉදි කිරීමේ ගෞරවයද එතුමන්ට ලබා දිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

එසේම, ගරු උපසභාපතිතුමාගේ මැදිහත්වීම සහ දායකත්වය මැද කාවන්තිස්සපුර තුරු සෙවණ ප්‍රදේශයේ පොළ භූමියක් ආරම්භ කිරීම සඳහා ද මැදිහත් වී කටයුතු කිරීම වෙනුවෙන් එතුමන්ට ස්තුතිය පුද කරන ලදී.

තවද, දෙබරවැව ක්‍රීඩාංගනය ක්‍රීඩා කටයුතු සඳහා පමණක් ලබා දී, විවධ සැණකෙළි, උත්සව පැවැත්වීම සඳහා පන්නෙගමුව ගොවි සෙවණ ක්‍රීඩාංගනය සංවර්ධනය කර සකස් කිරීමට අප පාලන කාලය තුළ කටයුතු කර ඇති අතර, එහි රාත්‍රී කාලයේ ද ක්‍රීඩා කිරීමට හැකි වන සේ ආලෝකමත් කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බවත් සඳහන් කරන ලදී.

අප විසින් සකස් කරන ලද 2023 අයවැය මගින් තිස්සමහාරාම බල ප්‍රදේශයේ ජනතාවට සුවිශේෂී වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර, අප පාලන කාලය තුළ ආරම්භ කල වැඩසටහනක් වන පෙර පාසල් දරුවන් සඳහා නිල ඇඳුම් ලබා දීමේ වැඩසටහන අපගේ සුවිශේෂී කරුණක් සේ සලකා 2023 වර්ෂයේ ද ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති බව දන්වා සිටින ලදී.

ජනතා විමුක්ති පෙරමුණ කාලය තුළ ආරම්භ කරන ලද කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය අසාර්ථක ව්‍යාපෘතියක් ලෙස පැවතීම හේතුවෙන්, එය අප පාලන කාලය තුළ සාර්ථකව පවත්වාගෙන යමින් කාබනික පොහොර නිපදවීම හොඳ ප්‍රමිතියකින් යුතුව සකස් කිරීමේ වැඩපිළිවෙල අද දක්වා ඉතාමත් සාර්ථකව සිදු කර ගෙන යනු ලබයි. ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට නොහැකි වුවත්, කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය ඉදි කිරීමේ කටයුතු වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණ පාලන කාලයට ස්තුතිය පුද කරන ලදී.

තවද, ආදාහනාගාරය ද ජනතා විමුක්ති පෙරමුණ කාලයේ ඉදි කරන ලද ව්‍යාපෘතියක් වුවත්, එහි පැවැති අඩුපාඩුකම් නිසා අසාර්ථක ව්‍යාපෘතියක් වුවත්, අප පාලන කාලය තුළ එහි අඩුපාඩුවක්ව සහ අවට ජනතාව අපහසුතාවයට පත් වන සේ සකස් කර ඇති ආදාහනාගාරයේ චිමිනිය, උසින් වැඩි කර සකස් කර, ජනතාවට පත් වන අපහසුතාවය මගහරවා ගැනීමට කටයුතු කළ අතර, එම සංවර්ධන කටයුත්ත ප්‍රාදේශීය සභාව මගින් සෘජු ශ්‍රමික පදනම මත සකස් කිරීමෙන් යම් මුදලක් ඉතිරි කර ගැනීමට හැකි විය. එලෙස අඩුපාඩු සම්පූර්ණ කර ගනිමින් මේ වන විට ඉතාමත් සාර්ථකව ආදාහනාගාරය පවත්වා ගෙන යාමේ කටයුතු සිදු කරන බව දන්වා සිටින ලදී.

ඉහතින් දක්වා ඇති ව්‍යාපෘති ජනතා විමුක්ති පෙරමුණ කාලය තුළ අඩුපාඩු සහිතව ආරම්භ කර ඇති ව්‍යාපෘති වුවත්, එම ව්‍යාපෘති කිසිවක් අත නොහැර පවතින අඩුපාඩුකම් සම්පූර්ණ කර ගනිමින් අප පාලන කාලය තුළ සාර්ථකව පවත්වාගෙන යාමට කටයුතු කළ බව සඳහන් කළ යුතුය.

දෙබරවැව සුසාන භූමිය තුළ මෘත දේහ අතුරු බහන් තැන් තැන්වල වැළලීම සිදු කිරීමෙන් එම අතුරුබහන් සතුන් විසින් එහා මෙහා ඇද දැමීම නිසා ඒ අවට ජනතාව දැඩි අපහසුතාවයකට පත්ව සිටි අවස්ථාවක, එකී අපහසුතාවය අවම කරමින්, අප පාලන කාලය තුළ සුසාන භූමිය ආවරණය වන පරිදි තාප්පයක් ඉදි කිරීමට කටයුතු කළ බවත්, එම සංවර්ධන කටයුත්තද සෘජු ශ්‍රමික පදනම මත සිදු කිරීම නිසා, ඒ සඳහා වැය වන මුදල අවම කර ගැනීමට හැකි විය. මෙම සංවර්ධන කටයුත්ත ඉදි කිරීමේ දී ඒ සඳහා මැදිහත් වූ ගරු උප සභාපතිතුමාටත්, නිවාස හා පූජා කමිටු හරහා මෙම සංවර්ධන කටයුත්ත සිදු වූ බැවින්, එය අධීක්ෂණය කිරීම වෙනුවෙන් නිවාස හා පූජා කමිටු සභාපති, ඩබ්.කේ. ටෂිත සමිල මහතාටත් ස්තුතිය පුද කරන ලදී.

එසේම අප සභාවට පත් වී එන විට වල් බිහි වී තිබූ සුසාන භූමි සහ ක්‍රීඩා පිටි සියල්ල අප කාලය තුළ සුද්ධ පවිත්‍ර කර, මායිම් ගල් ලකුණු කිරීමේ කටයුතු ද ආරම්භ කිරීමට කටයුතු කර ඇත.

තවද, අප පාලන කාලය තුළ සිදු කළ සුවිශේෂි කරුණක් ලෙස, සේවකයින්ගේ සුභ සාධනය උදෙසා සුවිශේෂි වැඩසටහන් ක්‍රියාත්මක කර, සුභ සාධක සමිතියට රුපියල් ලක්ෂ 16 ක මුදලක් උපයා දීමට හැකි වූ බව සතුටින් දැන්විය යුතුය. එසේම අනාගතයේ දී මෙම මුදල තව තවත් වැඩි කර ගනිමින් සේවකයින්ගේ සුභ සාධනය උදෙසා මුදල් උපයා ගැනීමට වැඩසටහන් සිදු කළ යුතු බවත් දන්වා සිටින ලදී.

ප්‍රාදේශීය සභා සෞඛ්‍ය කම්කරුවන් දෛනික අවශ්‍යතාවයන් සඳහා නිවසට අවශ්‍ය බඩු ඉතාමත් අධික මුදලකට මිලදී ගනු ලබයි. ධරිද්‍රතාවයෙන් පෙළෙන මෙම පිරිස සඳහා යම් සහනයක් ලබා දීමට සුභ සාධක සමිතිය හරහා සුභ සාධක අලෙවි කඩයක් ආරම්භ කිරීමට තීරණය කර ඇති අතර, මෙමගින් ඔවුන්ට යම් සහනයක් ලබා දීමට අපට හැකි වීමත් සතුටු විය හැකි කරුණකි.

සභාවට අයත් සියලු දේපළයන් මිණින්දෝරු අධිකාරිය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්ව හඳුනා ගෙන පවරා ගැනීමට අදාළ සියලු කටයුතු අප පාලන කාලය තුළ සිදු කරමින් පවතින අතර, කිරින්ද වෙරළ තීරය ද වත්කමක් ලෙස අප සභාවට අලුතින් එක් කර ගැනීමට බලාපොරොත්තු වන බවත් දන්වා සිටින ලදී.

තවද, වසර ගණනාවක සිටම පැවැත එන ගැටළුවක් ලෙස දෙබරවැව පාසල ඉදිරිපිට ඇති මුඩුක්කු සංහාර නිවාසවල ගැටළුව විසඳීමට, මිණින්දෝරු අධිකාරිය සමඟ සාකච්ඡා කර, පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව මෙම භූමිය සභාවේ ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් වී තිබුණත්, රජය සතු ඉඩමක් බවට එහිදී හඳුනා ගත් බැවින්, මේ සම්බන්ධයෙන් ගරු චමල් රාජපක්ෂ මැතිතුමාට සහ ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාට දැන්වූ පසුව මේ සම්බන්ධව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර, එහිදී ලබා දී ඇති තීරණයක් අනුව, ප්‍රාදේශීය ලේකම් මගින්, එම භූමියේ පදිංචි වී සිටින පවුල් සඳහා එම ඉඩම් නීත්‍යානුකූලව ලබා දීමට කටයුතු කරන ලදී. බොහෝ කාලයක සිට එන මෙම ගැටළුව අප පාලන කාලය තුළ විසඳා ගැනීමට හැකි විය.

ජනතා විමුක්ති පෙරමුණ කාලයේ කඩ කාමර සඳහා ලබා දී තිබූ තක්සේරුව පිළි නොගැනීම නිසා කඩ කාමර වෙනුවෙන් හිඟව තිබූ රුපියල් ලක්ෂ 96 ක මුදල කඩ හිමියන්ට ගෙවා ගැනීමට නොහැකිව, ඒ සඳහා මහා සභා අනුමැතිය ලබා ගෙන ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීමෙන් පසු, කපා හැරීමට කටයුතු කර, ජනතාව මුහුණ දී ඇති ගැටළුවෙන් එම ජනතාව මුදවා ගැනීමට අප කාලය තුළ කටයුතු කළ බව සඳහන් කරන ලදී.

තවද, ජනතා විමුක්ති පෙරමුණ කාලය තුළ ටිපර් රථ, මෝටර් ග්‍රේඩර් ආදීය ණය පදනම මත මිලදී ගත්තද, එම ණය මුදල් ගෙවා අවසන් කරන ලද්දේ 2018 වර්ෂයේ දීය. එහෙත් අප කාලය තුළ ණය ලබා ගනිමින් වාහන මිලදී නොගත් අතර, ගරු චමල් රාජපක්ෂ මැතිතුමාගේ සහ ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාගේ මැදිහත්වීම මත කම්පැක්ටර් 02, ජල බවුසරයක් සහ ගිණි නිවන රථයක් සකස් කර ගැනීමට අවශ්‍ය ට්‍රැක් රථයක් ගරු ප්‍රධාන අමාත්‍ය ශාන් විජය ලාල් ද සිල්වා මැතිතුමාගේ ප්‍රතිපාදන මත ලබා ගැනීමට හැකි වූ බව දන්වා සිටින ලදී.

අප පාලන කාලය තුළ රට තුළ විවිධ ව්‍යවසන තත්ත්වයන් මතු වුවත්, ඉහතින් සඳහන් කරන ලද සියලුම වැඩසටහන් ජනතාවාදී ලෙස සිදු කිරීමට හැකි වීම සම්බන්ධයෙන් අපට සතුටු විය හැකිය. කිසිදු ආයතනයකට ණයක් නොවී, අපට ලැබෙන ආදායම නිසි පරිදි කළමනාකරණය කර ගනිමින්, සියලු වැඩසටහන් සිදු කළ නිසා ආදායම් අඩු වුවත් හැකි පමණින් වැඩසටහන් සිදු කිරීමට හැකි විය. එසේම 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා අප සිදු කරන ලද සෑම කාර්යයක්ම සත්‍ය හා සාධාරණ ලෙස ගිණුම්කරණ මූල්‍ය ධර්මවලට අනුකූලව සිදු කර ඇති බවට විගණන දෙපාර්තමේන්තුවෙන් ද මත ලබා දී තිබීමත් අප සියලුම දෙනා ලබන්නාවූ ජයග්‍රහණයකි.

එසේම මෙකී සියලුම කාර්යයන් සිදු කර ගෙන යාම සඳහා සෑම විටකම සහාය ලබා දුන් ගරු උප සභාපතිතුමාටත්, ගරු සභික මඩුල්ලටත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලුම දෙනාටත් නැවතත් මාගේ ස්තූතිය පුද කරන ලදී.

තවද, අප සිදු කරන්නාවූ සෑම වැඩසටහනක් සඳහාම සහභාගී වී අපගේ පුවත් නිවැරදිව සෑම අවස්ථාවකම පුවත්පත්හි පල කිරීමට කටයුතු කරන මාධ්‍ය වේදී ඒ.ඒ. ප්‍රේමදාස මහතාටත්, රංජිත් ඩයමන් මහතාටත් නිරන්තරයෙන් අප සමඟ රැදී සිටීම වෙනුවෙන් ස්තූතිය පුද කරන ලදී.

- **අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා**

අද දින සුවිශේෂී කටයුත්තක් ලෙස 2023 වර්ෂයේ අයවැය සම්මත කර ගැනීම සිදු කරනු ලබයි. අප පාලන කාලය තුළ එනම් 2018 වර්ෂයේ සිට මේ දක්වාම ජනතාව වෙනුවෙන් සහ බල ප්‍රදේශයේ සංවර්ධන වෙනුවෙන් සිදු කරන ලද වැඩසටහන් පිළිබඳව සවිස්තරාත්මකව පැහැදිලි කිරීමක් ගරු සභාපතිතුමා විසින් සිදු කරන ලදී. 2018 වර්ෂයේ සිට ඇති විවිධ බාධාවන් නිසා අපට සිතූ පරිදි ජනතා සේවයක් ඉටු කර දීමට නොහැකි විය. එක් කාලයක් තුළ අපගේ ආණ්ඩුවක් නොමැතිව ප්‍රාදේශීය සභාවේ කටයුතු කිරීමට සිදු විය. ඉන් අනතුරුව පැමිණි සහරාන්ගේ බෝම්බ ප්‍රහාරයත්, කොරෝනා වසංගත තත්ත්වයත්, රට තුළ ඇති වූ ආර්ථික හා ඉන්ධන අර්බුධකාරී තත්ත්වයත් නිසා අපෙන් ජනතාවට ඉටු කළ යුතු සේවාවන් බොහෝ ප්‍රමාණයක් සිදු කර දීමට නොහැකි වුවත්, හැකි පමණින් හෝ ජනතාවට අවශ්‍ය සේවාවන් සේම සංවර්ධන කටයුතු සිදු කිරීමට කටයුතු කිරීම පිළිබඳ යම් සතුටක් ලැබිය හැකිය.

පසුගිය වර්ෂයන් තුළ ඇති වූ විවිධ බාධාවන් නිසා අප බල ප්‍රදේශයට වැඩි වැඩ කොටසක් සිදු කිරීමට නොහැකි වුවත්, 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය අනුව ඉතාමත් සාර්ථක වැඩ කොටසක් ගරු සභාපතිතුමාගේ ශක්තියෙන්, ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු සභිකයින්ගේ සහයෝගයෙන් තිස්සමහාරාම පුරවරයට කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

2023 අයවැය මගින් ග්‍රාමීය යටිතල පහසුකම් යටතේ කොට්ඨාස සංවර්ධනය සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබීම, ජන ජීවිතය නඟා සිටුවීම හා ආර්ථිකය නඟා සිටුවීම ආදී කරුණු යටතේ ද මුදල් වෙන් කර තිබීම මගින් සාර්ථක වැඩසටහන් සිදු කළ හැකි බව ප්‍රකාශ කරන ලදී.

රත්මිණිතැන්න ප්‍රදේශයේ ඉදි කරන ලද පෙර පාසල අප සභාවට අලුතින් එක් වන වත්කමකි. එම පෙර පාසලේ සංවර්ධන කටයුතු සඳහා සහ සභාවට අයත් අනෙක් පෙර පාසල් හි සංවර්ධන වැඩ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබීම පෙර පාසල් අධීක්ෂණ සභික ලෙස තමා හට සතුටු විය හැකිය.

බල ප්‍රදේශයන්වල සුසාන භූමි, ක්‍රීඩා පිටි සුද්ධ පවිත්‍ර කර මායිම් ගල් ලකුණු කිරීමේ කටයුතු ආරම්භ කිරීම නිවැරදි දෙයකි. බොහෝ අවස්ථාවල මායිම් සලකුණු නොකිරීම මත යම් යම් පුද්ගලයින් විසින් මෙකී භූමි ප්‍රමාණයන් අනවසරයෙන් අත්පත් කර ගැනීමේ අවස්ථාවන් තිබෙනු ඇත. මෙකී අනවසර අත්පත් කර ගැනීම් ද මෙමගින් වළකා ගැනීමට හැකි වනු ඇත.

සභාවට නව ආදායම් මාර්ග ව්‍යාපෘතියක් ලෙස තිස්සමහාරාම වැව් කණ්ඩියේ බෝට්ටු ජැටිය ඉදිකිරීමට සහ තිස්ස උසාවිය අසල පොදු සේවා ලබා ගත හැකි මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ සංවර්ධන ව්‍යාපෘති ඉතාමත් වටිනා නව ආදයම් උත්පාදන ව්‍යාපෘති ලෙස හැඳින්විය හැකිය.

අප පාලන කාලය තුළ අභියෝග රාශියක් මැද වැඩ කිරීමට සිදු වුවත්, 2023 වර්ෂය තුළ සාර්ථක ලෙස වැඩ කිරීමට හැකි ලෙසට අයවැය සකස් කර ගැනීමට හැකි වීම අප ලැබූ ජයග්‍රහණයක් වන අතර, එහි ඇතුළත් වැඩසටහන් 2023 වර්ෂයේ සාර්ථකව සිදු කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

2023 වර්ෂයේ අයවැය සඳහා පක්ෂව කටයුතු කරන බවත්, එය සාර්ථක අයවැයක් ලෙස සඳහන් කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.ඩබ්. නන්දා මහත්මිය</u>

මා ප්‍රාදේශීය සභාවට නවක සභිකයෙකු වුවත්, වසරක් 02 ක්ම ජනතාව වෙනුවෙන් සකස් කළ අයවැයට ඡන්දය ලබා දීමට හැකි වීමත් සතුටට කරුණක් සේම මා ලැබූ වාසනාවකි. අප සභාවේ දැක්මේ සඳහන් කර ඇති පරිදිම සෞභාග්‍යයේ දැක්ම තුළින් ජන සහභාගීත්වය ලබා ගනිමින් සෑම වැඩසටහනක්ම සාර්ථකව 2023 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

අප සභාවට මනා නායකත්වයෙන් හෙබි ශක්තිමත් සභාපතිවරයෙක් සිටී. සභාපතිතුමා සෑම විටකම ජනතාව වෙනුවෙන් වටිනා සේම සුවිශේෂී වැඩසටහන් සිදු කරනු ලබන බැවින්, 2023 වර්ෂයේ ද පෙර වර්ෂයන්ටත් වඩා වැඩි වැඩ කොටසක් සිදු කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී. එසේම ගරු සභාපතිතුමා සිදු කර ගෙන යන වැඩපිළිවෙල අගය කරන බවත් ප්‍රකාශ කර සිටින ලදී.

2023 වර්ෂයේ අයවැය සඳහා පක්ෂව කටයුතු කරන බව සඳහන් කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා</u>

2018 වර්ෂයේ සිට මේ දක්වාම රට තුළ ඇතැම් ව්‍යවසන තත්ත්වයන් ඇති වුවත් හැකි පමණින් ජනතාව වෙනුවෙන් සේවයක් ඉටු කිරීමට හැකි විය. 2023 වර්ෂයේ සකස් කරන ලද අයවැය මගින් ජනතාවට වඩාත් වැඩි වැඩ කොටසක්, ගරු උප සභාපතිතුමා, ගරු සභිකයින්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සහාය ලබා ගෙන ඉටු කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

2023 වර්ෂයේ අයවැය සඳහා පක්ෂව කටයුතු කරන බවත්, එය සාර්ථක අයවැයක් ලෙස සඳහන් කරන ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා**

2018 වර්ෂයේ සිට මේ දක්වා බැලීමේදී, 2023 අයවැය ඉතාමත් සාර්ථක අයවැයක් ලෙස සඳහන් කළ යුතුය. පසුගිය වර්ෂයන්වල ජනතාවට සිතූ පරිදි සේවාවන් ඉටු කිරීමට නොහැකි වුවත්, 2023 අයවැය මගින් කොට්ඨාසයන්වල ජනතාවට වැඩි වැඩ කොටසක් ගරු සභාපතිතුමා ඇතුළු ගරු උපසභාතිතුමාගේ සහ ගරු සභිකයින්ගේ සහාය ලබා ගෙන සිදු කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

2023 වර්ෂයේ අයවැය සඳහා පක්ෂව කටයුතු කරන බව සඳහන් කරන ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා**

2018 වසරේ සිට මේ දක්වා බලන විට 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය නිවැරදි සාර්ථක අයවැයක් ලෙස පෙන්වා දිය හැකිය.

2023 අයවැය මගින් ග්‍රාමීය සංවර්ධනය වැඩසටහන යටතේ අප කොට්ඨාසවල සංවර්ධනය සඳහා ද මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබීම සතුටට කරුණක් සේම, එම ප්‍රතිපාදන මගින් 2023 වසරේ අප කොට්ඨාසවල සංවර්ධන කටයුතු කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

2023 වර්ෂයේ අයවැය සඳහා පක්ෂව කටයුතු කරන බවත්, එය සාර්ථක අයවැයක් ලෙස සඳහන් කරන ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා**

2018 වර්ෂයේ අප ප්‍රාදේශීය සභාවට පත් වීමත් සමඟ අප හොඳ නිවැරදි නායකයෙක් තෝරා ගැනීම පිළිබඳ අද අපට සතුටු විය හැකිය. සභාපතිතුමාගේ හොඳ නායකත්වයත්ව සහ දූරදර්ශී ක්‍රියාවන් නිසා පසුගිය වර්ෂයන්වල රට තුළ වැඩ කිරීමට නොහැකි ලෙසට ඇතැම් බාධාකාරී තත්ත්වයන් මතු වුවත්, හැකි පමණින් හෝ ජනතාවාදී සේවයන් ලබා දීමට හැකි විය. ගරු සභාපතිතුමා විසින් සාර්ථක නිවැරදි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම නිසාම විගණන දෙපාර්තමේන්තුවෙන්ද සත්‍ය හා සාධාරණව ගිණුම්කරණ මූලා ධර්මයන්ට අනුකූලව කටයුතු කර ඇති බවට මත ලබා දී තිබීම අප සියලුම දෙනාට සතුටු විය හැකි කරුණක් බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමාගේ නිවැරදි නායකත්වය මැද ඉදිරියටත් ජනතාවාදී සේවාවන් රැසක් අප සියලුම දෙනාට සිදු කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

2023 වර්ෂයේ අයවැය සඳහා පක්ෂව කටයුතු කරන බව සඳහන් කරන ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා**

සංවර්ධන කටයුතු රාශියක්, ජනතාවට සේවාවන් ඉටු කිරීමට හැකි වැඩපිළිවෙලවල් රැසක් එක් වී ඇති සාර්ථක අයවැයක් ලෙස 2023 අයවැය සඳහන් කළ හැකිය. ගරු සභාපතිතුමාගේ නිවැරදි නායකත්වය දූරදර්ශී දැක්ම සහ ගරු උප සභාපතිතුමාගේ, ගරු සභිකයින් සහ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සහාය ලැබුණු නිසා අප සියලුම දෙනාට මේ දක්වා සෑම කාර්යයක්ම සාර්ථකව සිදු කිරීමට හැකි වී ඇත.

තම කොට්ඨාසයේ මහජන පීඩාවක්ව තිබූ ආදාහනාගාරයේ චිමිනිය උසින් වැඩි කර සකස් කිරීම, ආදාහනාගාරය වටා බසින ඇලේ පැති බැම්ම සකස් කර වැටක් ඉදි කිරීම, ආදාහනාගාරය ඉදිරිපිට රථවාහන නැවතුම්පොළ සකස් කිරීම, උසාවිය ඉදිරිපිට මාර්ගය කාපට් අතුරා සකස් කිරීම, උසාවිය ඉදිරිපිට සුසාන භූමියේ වැට සකස් කිරීම ආදී වැඩසටහන් රැසක් සිදු කිරීමට හැකි වූ බව කිව යුතුය. එසේම උසාවිය ඉදිරිපිට වාහන නැවතුම්පොළක් ඇතුළුව පොදු පහසුකම් ලබා දෙන ස්ථානයක්

සකස් කිරීමේ ව්‍යාපෘතියද තම කොට්ඨාසයේ සිදු කිරීමට තීරණය කර ඇති බවත් සතුටින් දන්වා සිටින ලදී.

ජනතාව වෙනුවෙන් සභාව විසින් සිදු කරන්නා වූ සෑම කටයුත්තක් සේම සංවර්ධන ව්‍යාපෘති සඳහා ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු සභිකයින්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය ලබා දෙන්නාවූ සහාය අපරිමිතය. ඒ වෙනුවෙන් එම සියලුම දෙනාට ස්තුතිය පුද කරන ලදී.

තිස්සමහාරාමයට කොපමණ වැඩ කළත්, කිසිදු වටිනාකමක් නොදුන්නත්, අප පත් වූ දින සිට ප්‍රාදේශීය සභාව තුළ අප ආණ්ඩුවක් නොමැතිව කටයුතු කිරීමට සිදු වීම, සහරාන්ගේ බෝම්බ ප්‍රහාරය, කොරෝනා වසංගත තත්ත්වය, ආර්ථික හා ඉන්ධන අර්බුධකාරී තත්ත්වයන් බාධාවන් සේ පැමිණියත් හැකි පමණින් ජනතා සේවයක් සිදු කළ බව ප්‍රකාශ කළ යුතුය. එසේම පෙර වර්ෂයන්ට සාපේක්ෂව නගර අලෝකමත් කිරීම සඳහා අධි දීප්ත විථි පහන් සවි කිරීම, අන්ධකාරයේ පැවැති වැව් කණ්ඩි ආලෝකමත් කිරීම සහ ආකර්ෂණය වන ලෙස නගර අලංකරණය කිරීම, වට රවුම අලංකරණයට අදාළ කටයුතු මේ වන විට දැඩි අසීරුතා මැද සිදු කරන ලද කාර්යයන් ලෙස හඳුන්වා දිව හැකිය.

2023 වර්ෂය සඳහා සම්මත කරන ලද අයවැය අපගේ අවසන් අයවැය ද විය හැකිය. මැතිවරණයක් පැමිණියත් අප කිසි දිනක බිය නොවනු ඇත. ආණ්ඩු පක්ෂය වශයෙන් ඉදිරිපත් වී ජයග්‍රහණය කිරීමට අපට හැකියාව පවතින බවත් සඳහන් කරන ලදී.

2023 වර්ෂයේ අයවැය සඳහා පක්ෂව කටයුතු කරන බවත්, එය සාර්ථක අයවැයක් ලෙස සඳහන් කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම – ගරු ප්‍රාදේශීය සභා සභික, චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවිය</u>

වසර 05 ක් පුරාවට ආ ගමන අභිමානනීයයි. අප ආ ගමන ලෙස බලන කළ 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය පෙර වර්ෂයන්ටත් වඩා සාර්ථක සුවිශේෂී අයවැයක් ලෙස සඳහන් කළ හැකිය. පෙර වර්ෂයන් තුළ ඉතාමත් අභියෝගමත් කාලයක් තුළ, ආයතනය අඩු ආදායම් ලබමින් හැකි පමණින් හෝ ජනතා සේවයක් ඉටු කිරීමට හැකි වීම පිළිබඳව අපට සතුටු විය හැකිය. එලෙස අභියෝග බාධක ජය ගෙන මේ වන තෙක් ජනතා සේවයක් ඉටු කිරීම සඳහා නායකත්වය ලබා ලබා දුන් ගරු සභාපතිතුමාටත්, ගරු උප සභාපතිතුමා, ගරු සභිකයින් සහ ලේකම්තුමිය ඇතුළු නිලධාරී මණ්ඩලයටත් ස්තුතිය පුද කළ යුතුය.

2023 වර්ෂයේ අයවැය විනිවිදභාවයෙන් යුතුව නිවැරදිව සකස් කර ඇති අයවැයක් ලෙස පෙන්වා දිය හැකිය.

2023 අයවැය මගින් පුස්තකාල, පෙර පාසල්, කාන්තා හා ළමා හිංසනය පිළිබද වැඩසටහන් පැවැත්වීම, ග්‍රාමීය සංවර්ධන සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබීම ඉතාමත් හොඳ දෙයකි. ග්‍රාමීය සංවර්ධන යටතේ වෙන් කර ඇති මුදලින් කොට්ඨාසවල ප්‍රමුඛතා වැඩසටහන් තෝරා ගනිමින් සිදු කිරීම සුදුසු වනු ඇත. කාන්තා හා ළමා හිංසනය පිළිබද වැඩසටහන් තිස්සමහාරාම බල ප්‍රදේශයේ සියලුම ජනතාවට සිදු කළ යුතුය. එම නිසා 2023 වර්ෂයේ හෝ වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් මෙමෙ වැඩසටහන් සාර්ථකව සිදු කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය මගින් අප සභාවට ලැබිය යුතු ආදායම් සියල්ල නිසි පරිදි ලබා ගනිමින් තිස්සමහාරාම පුරවරයටම ඉතා සාර්ථක වැඩ කොටසක් කිරීමට 2023 වර්ෂයේ හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

2023 වර්ෂයේ අයවැය සඳහා පක්ෂව කටයුතු කරන බවත්, එය සාර්ථක අයවැයක් ලෙස සඳහන් කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා</u>

2023 වර්ෂයේ අයවැය සකස් කිරීම වෙනුවෙන් ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තුතිය පුද කරන ලදී.

සභාවට නව ආදායම් මාර්ගයක් ලෙස අඳගලවැල්ල සංවර්ධනය කිරීමට ගත් යෝජනාව ඉතා හොඳ දෙයකි. ඒ සඳහා අපගේ ද සහාය ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී.

2023 අයවැය සකස් කිරීමේ දී ආධාර සහ ප්‍රධාන යටතේ මුදල් ප්‍රතිපාදන ලබා ගැනීම වැඩියෙන් අපේක්ෂා කර තිබුණද, රටේ තිබෙන ආර්ථික අර්බුධකාරී තත්ත්වයන් සමඟ මෙම ආධාරයන් ලබා ගැනීමට හැකි වේද යන්න ගැටළුවක් පවතී. මෙම ආධාර හා ප්‍රධාන ලබා ගැනීමට නොහැකි වුවහොත් අයවැය මගින් සිදු කිරීමට අපේක්ෂිත වැඩසටහන් සිදු කිරීමට නොහැකි වීම මත, ජනතා අභිලාෂයන් ඉටු කර දිය නොහැකි වන බව අපගේ විශ්වාසයි. තවද, අයවැය සකස් කිරීමේදී ඉලක්කම් එහා මෙහා කර ලේඛන සකස් කළද, එමගින් ජනතාවට වඩාත් ඵලදායි සේවාවක් ඉටු කළ හැකි ද යන්නත් ගැටළුවක් පවතින බව ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශීය සභාවේ භාවිතාව සහ ක්‍රියාකාරීත්වයන් ඇතුළත මුලින් තිබූ තත්ත්වයන් පසුව නැතිවී ගොස් ඇති බව කිව හැකිය. තවද, ඇතැම් අවස්ථාවල සභාවේ තීන්දු තීරණ ගැනීමේදී අත්තනෝමතික තීන්දු තීරණ ගත් අවස්ථාවන් ද පවතින බව කිව යුතුය. උදාහරණයක් ලෙස, දෙබරවැව පොදු ක්‍රීඩාංගනය ක්‍රීඩා කටයුතුවලට හැර වෙනත් කිසිදු උත්සව කටයුත්තක් සඳහා නොදෙන බවට ගත් තීරණය පසුව උල්ලංඝනය කරමින්, නැවත වසරක් සඳහා අවස්ථා තුනක් විවිධ උත්සව සඳහා ලබා දීමට තීරණය කරන ලදී. එසේම දෙබරවැව පොදු වෙළඳපොළ රැස්වීම් සඳහා පෙර වර්ෂයන්වල ලබා දී තිබුණද, අප විසින් රැස්වීමක් සඳහා ලබා දෙන ලෙසට ඉල්ලීම් කළ පසුව, කිසිදු තීන්දු තීරණයක් නොමැතිව එම භූමිය ලබා නොදීමට කටයුතු කරන ලදී. එලෙසටම ගරු සභිකයින් වන අප යම් යම් කාරණා සම්බන්ධයෙන් නිලධාරීන් සමඟ සාකච්ඡා කළ අවස්ථාවන් පෙර පැවැතියද, එම අවස්ථාවද අපට අහිමි කරමින් නිලධාරීන් සමඟ කතා කිරීම තහංචි කර ඇත. මෙකී සියලු කරුණු කාරණා ගත් කළ සභාවෙන් ගනු ලබන තීන්දු තීරණ යම් අත්තනෝමතික පැත්තකට යොමු වී ඇති බව සඳහන් කළ යුතුය.

2023 වර්ෂයේ අයවැය සඳහා ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය නියෝජිතයින් දෙදෙනා විරුද්ධ බවත්, බෙදීමක් ඉල්ලන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>දෙබරවැව පොළ භූමිය පවතින්නේ පොළ පවත්වාගෙන යාම සඳහාය. සභාවට බදු ගෙවමින් ඒ අවට වෙළඳාම් කරන අයට රැස්වීම් පැවැත්වීමෙන් යම් අපහසුතවයකට පත්වන බව ඔවුන් සභාවට ද දන්වා ඇති බැවින්, රැස්වීම් සඳහා දෙබරවැව පොළ භූමිය ලබා නොදීමට තීරණය කළ බව ප්‍රකාශ කරන ලදී.</u>

<u>දෙබරවැව පොදු ක්‍රීඩාංගනය ද නැවත සංගීත ප්‍රසංග, සැණකෙළි සහ උත්සව සඳහා ලබා දීම සම්බන්ධයෙන් ගරු උප සභාපතිතුමා ප්‍රධාන කමිටුවක් පත් කර, එම කමිටුව මගින් ලබා ගත් නිර්දේශයන් අනුව, මහා සභාව තීරණයක් නැවත ලබා ගනිමින් වසරකට වැඩසටහන් 03 ක් වන සේ එකී වැඩසටහන් සඳහා ක්‍රීඩාංගනය ලබා දීමට තීරණ කරන ලදී. එකී තීරණය ලබා ගැනීම නිසා තිස්සමහාරාම ප්‍රාදේශීය සභා සුභ සාධක සමිතියට ආධාර පිණිස වෙළඳ සැණකෙලියක් පවත්වා, සුභ සාධක සමිතියට විශාල මුදලක් උපයා ගැනීමට හැකි වූ අතර, එම මුදලින් සේවකයින්ගේ සුභ</u>

සාධනය උදෙසා සාර්ථක වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති බවත් දන්වා සිටින ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා**

මාගේ හෘදසාක්ෂියට එකඟව මා 2023 වර්ෂයේ අයවැය සඳහා සහාය ලබා දෙන අතර, මෙම අයවැය තිස්සමහාරාම බල ප්‍රදේශයේම ජනතාව වෙනුවෙන් සකස් කළ අයවැයක් නිසා ඒ සඳහා අනිවාරයෙන්ම මාගේ සහාය ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී. 2011 වර්ෂයේ සිට මා ගරු සභිකයෙක් ලෙස නියෝජනය කළ සෑම වර්ෂයකම ජනතාව වෙනුවෙන් ඉදිරිපත් කරන අයවැය සඳහා පක්ෂව ඡන්දය ලබා දී ඇත. බුදු දහම අනුව සරු දේ සරු ලෙසත්, නිසරු දේ නිසරු ලෙසත් වෙන් කර අප ලබා ගත යුතුය. 2018 වර්ෂයේ සිට පත් වූ මෙම පාලනය තුළ යම් කාලයක් ආණ්ඩුවක් නොමැතිව සභාවේ කටයුතු සිදු කර ගෙන යාමට සිදු වූ බවත්, ඉන් අනතුරුව සහරාන්ගේ බෝම්බ ප්‍රහාරයත්, කොරෝනා වසංගත තත්ත්වයත් සහ රට තුළ ඇති වූ ඉන්ධන හා ආර්ථික අර්බුධකාරී තත්ත්වයන් නිසා සිතූ පරිදි වැඩසටහන් කිරීමට නොහැකි වුවත්, සභාවට ලැබූ ආදායමින් හැකි පමණින් ජනතා සේවයක් ඉටු කිරීමට ගරු සභාපතිතුමා විසින් කටයුතු කරන ලදී. පෙර වර්ෂයන්වල එම බාධාවන් හමුවේ ද ජනතා සේවයක් ඉටු කිරීමට හැකි වුයේ නම්, 2023 වර්ෂයේ සකස් කරන ලද අයවැය මගින් ඉතාමත් සාර්ථක ලෙස වැඩ රාශියක් ජනතාවට සිදු කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

2023 වර්ෂයේ සකස් කරන ලද අයවැය මගින් සිදු කිරීමට අපේක්ෂා කරන ලද වැඩසටහන් ඒ ආකාරයෙන්ම සිදු කිරීමට ගරු සභාපතිතුමාට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී. එසේම ගරු සභාපතිතුමාට මේ දක්වාත් ජනතාව වෙනුවෙන් කටයුතු කිරීමට හැකි වුයේ ගරු සභාපතිතුමාගේ හොද නායකත්වය, දක්ෂතාවය සේම ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු සභිකයින්ගේද, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ ද ලබා දුන් සහාය නිසා බව කිව යුතුය.

2023 අයවැය යටතේ සෞඛ්‍ය සේවා කටයුතු සිදු කරන ලද සේවාවන් ලෙස ආදාහනාගාර සේවාව ගත් කළ පසුගිය වර්ෂයන්වල ගෑස් මිල ඉහල යාමත් සමඟ ගෑස් නොමැති වුවත්, ගෑස් ගෙන්වා ගනිමින් ආදාහන සේවාව සිදු කරන ලද අතර, ඒ සඳහා අවශ්‍ය සේවකයින් කොරෝනා වසංගත තත්ත්වය මැද වුවද සේවයට ගෙන්වා ගනිමින් අදාල සේවාවන් ලබා දීමට ගරු සභාපතිතුමා විසින් කටයුතු කරන ලදී.

භෞතික සැලසුම් හා මංමාවත් යටතේ රට තුළ කුමන බාධාක පැමිණියත් ගරු සභාපතිතුමාගේ සහ ගරු සභිකයින්ගේ හැකියාව මැදිහත්වීම මත සංවර්ධන කටයුතු හැකි පමණින් ඉටු කර ඇති අතර, 2023 වර්ෂයේ ද ග්‍රාමීය සංවර්ධන සඳහා වෙන් කර ඇති මුදලින් කොට්ඨාසයන්හි මාර්ග සඳහා සේම බෝක්කු සඳහා ද මුදල් වෙන් කිරීම ගරු සභාපතිතුමාගේ දුරදර්ශි ක්‍රියාවක් ලෙස සඳහන් කළ යුතුය.

සභාවේ වත්කම් හදුනා ගෙන, ඒවා ආරක්ෂා කර ගැනීම සඳහා මේ වන විට සිදු කර ගෙන යන වැඩපිළිවෙල ඉතාමත් හොද දෙයක් වන අතර, 2023 වර්ෂයේ ද සභාවේ වත්කම් ආරක්ෂා වන පරිදි ඉතිරි වැඩ කටයුතු ද සිදු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

පොදු උපයෝගීතා සේවා යටතේ ජනතාවගේ එදිනෙදා අවශ්‍යතාවයන් සඳහා වන සංවර්ධන කටයුතු සඳහාත්, සුභ සාධ සේවා යටතේ ජනතා සේවාවන් ඉටු කිරීම සඳහා ද මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබීම හොද දෙයකි.

මා මින් ඉදිරියට දේශපාලනය කිරීමට කිසිදු බලාපොරොත්තුවක් නොමැති නිසා, මා අයවැය සඳහා ඡන්දය ලබා අවසන් අවස්ථාව මෙය වන බව ප්‍රකාශ කරන ලදී. එසේම මා නැවත දේශපාලන සිදු

නොකලත් ගමේ ජනතාවගේ ප්‍රශ්න ගැටළු පිළිබදව කතා කිරීම සඳහා සභාවේ පැවැත්වෙන කමිටු සඳහා මා සහභාගී කරවා ගන්නා ලෙසට ඉල්ලා සිටින ලදී.

විපක්ෂ නායකතුමාට හදිසි අවශ්‍යතාවයක් මත අද දින පැමිණීමට නොහැකි වුවත්, එතුමා සෑම වර්ෂයකම ජනතාව වෙනුවෙන් ඉදිරිපත් කරන අයවැය සම්මත කිරීම සඳහා සහාය ලබා දී ඇත.

අප පාලන කාලය අවසන් වුවත්, ඊළඟට තිබෙන ඡන්දයෙන් නැවතත් තේරී පත් වී ජනතාවාදී සේවයක් ඉට කිරීමට ගරු සභාපතිතුමාට ශක්තිය ධෛර්ය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරන අතර, සියලුම කටයුතු සඳහා ආශිර්වාද ප්‍රාර්ථනා කරන ලදී.

2023 වර්ෂයේ අයවැය සඳහා පක්ෂව කටයුතු කරන බව සඳහන් කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා</u>

මා සභිකයෙක් ලෙස නියෝජනය කරන 2011 වර්ෂයේ සිට බැලූ කළ අයවැය සඳහා ඡන්දය ලබා දෙන 10 වැනි අයවැය මෙය ලෙස කිව හැකිය. එලෙස සම්මත කරන අයවැය 10 පුරාවටම සෑම අයවැයක් සඳහාම ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ නියෝජිතයින් විරුද්ධ වී ඇත. අයවැය සඳහා විරුද්ධ වන්නේ නම් සාධාරණ හේතු සාධක තිබිය යුතුය. 2023 අයවැය සඳහා එම සභිකයින් විරුද්ධ වන්නේ ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ රැස්වීමක් සඳහා පොළ භූමිය ලබා නොදීමටත්, දෙබරවැව ක්‍රීඩාංගනය උත්සව කටයුතු සඳහා නැවත ලබා දීමේ තීරණයටත්, එම සභිකයින්ට අවශ්‍ය තොරතුරු නිලධාරීන් වෙතින් ලබා ගැනීමට නොහැකි වීමේ හේතු සාධක නිසාය. අයවැයක් සඳහා සහාය ලබා දීමට මෙම හේතු සාධක කිසිසේතම බලපෑමක් නොවන බව කිව යුතුය.

බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සේවයක් කිරීම සඳහා සකස් කරන ලද අයවැය සඳහා කිසිදු සාධාරණ හේතු නොමැතිව, අනවශ්‍ය කරුණු නිසා ජනතා විමුක්ති පෙරමුණ සභිකයින් විරුද්ධ වන්නේ නම්, මෙම පක්ෂය රට භාර ගත්හොත්, රටට කුමක් සිදුවේද යන්න සිතා ගත නොහැක. ජනතාව වෙනුවෙන් සකස් කරන කරන ලද ජනතාවාදී අයවැය සඳහා විරුද්ධ වන්නේ කොන්ද පණ නැති කුහක මිනිසුන් ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ සිටීම නිසාය.

ග්‍රාමීය සංවර්ධනය යටතේ කොට්ඨාසයන්හි සංවර්ධන කටයුතු සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබීම සතුටට කරුණකි. තම කොට්ඨාසය සඳහා අප නියෝජනය කරන පක්ෂයේ ගරු අමාත්‍යවරුන්ගේ ප්‍රතිපාදන ලබා ගනිමින් සංවර්ධන කටයුතු සිදු කළද, ජනතාව විසින් කොට්ඨාසය නියෝජනය කරන අප වෙතින් ප්‍රාදේශීය සභාව විසින් කොට්ඨාසයන් සඳහා සිදු කර ඇත්තේ කුමක්ද යන්න විමසුවහොත්, ලබා දීමට පිළිතුරක් නොමැත. එම නිසා ලබන වසරේ හෝ තම කොට්ඨාසයට ප්‍රාදේශීය සභාවෙන් යම් සංවර්ධන කටයුත්තක් සිදු කළ යුතුය. තවද, තම කොට්ඨාසයට අයත් අඳගලවැල්ල ප්‍රාදේශීය සභාව විසින් සංවර්ධනය කිරීමට ගත් යෝජනාව වඩාත් නිවැරදි එකකි. එම නිසා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

එසේම කිරින්ද පොළ ද සංවර්ධනය කර, සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතු බව දන්වා සිටින ලදී.

පෙර පාසලක් නොමැති ප්‍රදේශයක් තෝරා ගනිමින් සභාවට පවරා ගැනීමට නියමිත පෙර පාසල් ලේඛනය සඳහා තම කොට්ඨාසයෙන් පෙර පාසලක් තෝරා පත් කර දී ඇති බැවින්, කඩිනමින් පෙර පාසල් 10 සභාවට පවරා ගැනීමට කටයුතු කිරීම සුදුසු වනු ඇත.

2023 වර්ෂයේ අයවැය මගින් හෝ අප ගමට යම් දෙයක් සිදු කළ යුතුය. මෙකී සියලු කටයුතු සිදු කිරීම සඳහා ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු සභිකයින්, ලේකම්තුමිය ඇතුළු නිලධාරී මණ්ඩලයේ සහාය ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරමි.

2023 වර්ෂයේ අයවැය සඳහා පක්ෂව කටයුතු කරන බවත්, එය සාර්ථක අයවැයක් ලෙස සඳහන් කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා</u>

යම් ආයතනයක යම් වර්ෂයක අයවැයක් සකස් කරන්නේ නම්, උපයන ආදායමට සරිලන පරිදි අයවැය සකස් කරනු ලබයි. අප පත් වූ සෑම පාලන කාලයක් තුළම හැකි පමණින් හෝ සකස් කරන ලද අයවැයට එහා ගොස් වැඩක් කිරීමට උත්සාහ ගෙන ඇත. ප්‍රාදේශීය සභා ඉතිහාසය ගත් කළ ඉතාමත් කැපවීමෙන් හා ඕනෑකමින් යුතුව කටයුතු කර ඇති නායකයින් සිටියා සේම, අප ගරු සභාපතිතුමා ද ජනතාව වෙනුවෙන් එලෙස ඉතාමත් ඕනෑකමින් හා කැපවීමෙන් යුතුව කටයුතු කරන සභාපතිවරයෙක් ලෙස හැඳින්විය හැකිය. 2022.05.09 වන දින සිදුවීමෙන් ගරු සභාපතිතුමාගේ නිවාස කුඩු කර විනාශ කර දැමුවද, තිස්සමහාරාමයේ මුල් පුරවැසියා ලෙස ගරු සභාපතිතුමා සතියේ දින 07 තුළම දිවා රෑ නොබලා සභා කාර්යාලයේ හිඳ ජනතාව වෙනුවෙන් සේවය කර ඇති බවත්, එතුමන්ගේ එම නායකත්වය අගය කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශීය සභාව යනු පෙර පාසල් දරුවාගේ සිට මහලු මිනිසා දක්වාම සේවා සැපයීමට බැඳී සිටින ආයතනයකි. අප සකස් කරන ලද 2023 අයවැය මගින් ගමට හොඳ ආදර්ශයක් ලබා දිය හැකි පරිදි ගමට වැඩි වැඩ කොටසක් කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

නැවත මැතිවරණයක් පැවැත්වීමට කටයුතු කළත්, කොට්ඨාස ක්‍රමයට එම මැතිවරණය පවත්වා නිවැරදි තීන්දු තීරණ ලබා ගත හැකි පුද්ගලයෙකු තෝරා පත් කර ගත් පසු, ගමේ ජනතාවගේ සියලු අවශ්‍යතාවයන් සොයා බලා ඉටු කිරීමට හැකි වන බව ප්‍රකාශ කර සිටින ලදී.

2023 අයවැය සම්මත කර ගැනීමට පෙර අයවැය කමිටු පවත්වා, අයවැය කෙටුම්පත සම්මත කර ගැනීම සිදු කරනු ලබයි. අයවැය වාර්තාවේ යම් අඩුපාඩු පවතින්නේ නම් එය අයවැය සම්මත කිරීමට පෙර, අයවැය කෙටුම්පත සම්මත කරන අවස්ථාවේ පෙන්වා දිය යුතුය. අයවැයට විරුද්ධ වන්නේ නම් ඒ සඳහා සාධාරණ හේතු සාධක නොමැතිව අයවැය සම්බන්ධයෙන් වැරදි පූර්වාදර්ශ ගමට ලබා නොදිය යුතු බව ප්‍රකාශ කර සිටින ලදී.

තම කොට්ඨාසය තුළ අලුතින් ඉදි කරන ලද පෙර පාසල ඉදි කිරීමට අදාළ ලිපි කටයුතු සහ අනෙකුත් කටයුතු 2017 වර්ෂයේ සිට සිදු කරන ලදී. අප පක්ෂය නියෝජන කරනු ලබන ගරු අමාත්‍යවරුන්ගේ ප්‍රතිපාදන ලබා ගනිමින් මෙහි සංවර්ධන කටයුතු සිදු කිරීම ආරම්භ කළද, මෙහි අවසන් ගෞරවය හිමි වන්නේ ප්‍රාදේශීය සභාවට වීමටත් සතුටට කරුණකි.

තම කොට්ඨාසය තුළ ඉදි කරන ලද පොළ භූමිය ද තමාගේ දැඩි මැදිහත්වීම සහ දායකත්වය ලබා දෙමින් ඉදි කරන ලද සංවර්ධන කටයුත්තක් ලෙස පෙන්වා දිය යුතුය.

2023 අයවැය මගින් කොට්ඨාසයන් සඳහා ප්‍රධාන වශයෙන් සිදු කළ යුතු කාර්යයන් හඳුනා ගනිමින්, එකී කටයුතු ඉටු කිරීමට සියලුම ගරු සභිකයින් වග බලා ගැනීම සුදුසු වන බව ප්‍රකාශ කර සිටින ලදී.

2023 වර්ෂයේ අයවැය සඳහා පක්ෂව කටයුතු කරන බවත්, එය සාර්ථක අයවැයක් ලෙස සඳහන් කරන ලදී. එසේම 2023 වර්ෂයේ අයවැය මල්ඵල ගැන්වීම සඳහා මාගේ පූර්ණ සහාය ලබා දෙන අතර, 2023 වසරේ සියලු කටයුතු කිසිදු බාධාවකින් තොරව සාර්ථකව සිදු කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, චමින්ද ඩයස් වන්නිගේ මහතා</u>**

අප පක්ෂයක් ලෙස ජනතාවාදීව සකස් කරන ලද අයවැය සඳහා කිසි දිනක විරුද්ධ නොවනු ඇත. ගරු සභාපතිතුමාගේ නිවැරදි නායකත්වයත් හොඳ මනුෂ්‍යත්වයත් නිසා මා 2023 වර්ෂයේ සකස් කරන අයවැය සඳහා සහාය ලබා දී කටයුතු කරනු ඇත. අයවැය සම්මත කරන අවස්ථාවේ දී නිහඩ වී සිටිනුයේ ඒ සඳහා විරුද්ධ වීමට නොවන බවත්, අපගේ එම නිහඩතාවය හැල්ලු කිරීමට කිසිවකුත් උත්සාහ නොගන්නා ලෙසත් දන්වා සිටින ලදී.

2023 වර්ෂයේ අයවැය සඳහා පක්ෂව කටයුතු කරන සඳහන් කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

✓ අවසානයේ සියලුම දෙනාගේ අදහස් සලකා බැලීමෙන් පසු, මෙහි බෙදීමකට ලක් වන නිසා, 2023 වර්ෂයේ අයවැය සඳහා ඡන්ද විමසීමක් සිදු කරන ලදී. එහිදී,

- **අද දින පැමිණි ගරු සභිකයින් සංඛ්‍යාව - 16**
- **2023 වර්ෂයේ අයවැයට පක්ෂව ඡන්දය ලබා දුන් ගරු සභිකයින් ගණන - 14**
- **2023 වර්ෂයේ අයවැයට විපක්ෂව ඡන්දය ලබා දුන් ගරු සභිකයින් ගණන - 02**

**ගරු සභාපති වන තමා ඇතුළුව 14 දෙනෙකුගේ ඡන්දයෙන් 2023 වර්ෂයේ තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ අයවැය සම්මත කරන ලදී.**

**ඒ අනුව, 2023 වර්ෂයේ අයවැය වැඩි ඡන්ද 13 කින් සභා සම්මත විය.**

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

පසුගිය වර්ෂයන්වල අයවැය මගින් වැඩසටහන් සඳහා වෙන් කරන ලද මුදලින් හැකි පමණින් වැඩ සටහන් සිදු කළා සේම, 2023 අයවැය මගින් ද වෙන් කරන ලද ප්‍රතිපාදන මුදලන් එම වර්ෂයේ සාර්ථක ලෙස වැඩසටහන් සිදු කිරීමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කර සිටින ලදී.

අප පාලන කාලය තුළ මේ දක්වාම කිසිදු මාර්ගයක් සංවර්ධනය කර දීමට නොහැකි වූ ගරු සභික, ආර්.කේ.එම්. රොහිත මහතාගේ කොට්ඨාසයේ මාර්ග සංවර්ධනය සඳහා 2023 වර්ෂයේ ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කරන බව සඳහන් කරන ලදී.

රට තුළ ඇති වූ ව්‍යවසන තත්ත්වයන් හමුවේ සභාවේ ආදායම් ඉතාමත් පහල බැසීමක් සිදු වුවත්, ගරු උප සභාපතිතුමා, ගරු සභිකයින් සහ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය ලබා දුන් සහයෝගයත් සමඟ හැකි පමණින් ජනතාවට වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකි වූ බවත්, 2023 වසරේ අයවැය මගින් වෙන් කර ඇති ප්‍රතිපාදන මගින් අදාළ වැඩසටහන් කිරීම සඳහා ඉදිරියටත් සහයෝගය ලබා දෙන ලෙසටත් ඉල්ලා සිටින ලදී.

එසේම සෑම වසරක් පාහේම ජනතාව වෙනුවෙන් සකස් කරන ලද අයවැය සඳහා විපක්ෂයෙන් ලබා දෙන සහාය අප රටටම ආදර්ශයකි. ඒ වෙනුවෙන් ගරු විපක්ෂ නායකතුමා ඇතුළු සියලුම විපක්ෂයේ ගරු සභිකයින් වෙත ස්තුතිය පුද කරන ලදී.

අද දින 2023 වර්ෂයේ අයවැය සම්මත කර දීම සඳහා පැමිණි පක්ෂ විපක්ෂ සියලුම ගරු සභිකයින් වෙත තම ගෞරවණීය ස්තුතිය පුද කරන අතර, අයවැය සඳහා ජනතා විමුක්ති පෙරමුණ ගරු සභිකයින් විරුද්ධ වුවත්, අප හට අයවැය සම්මත කර ගැනීමට හැකි වූ බවත්, ඉදිරියේ දී ජනතා විමුක්ති පෙරමුණ ගරු සභිකයින්ට ද අප හා එක්ව ජනතාවාදී සේවයක් ඉටු කිරීමට ගුණ නුවණ පහල වේවායි කියා ප්‍රාර්ථනා කරන ලදී.

එසේම තමා විසින් සිදු කරන්නාවූ ව්‍යාපෘති, සංවර්ධන කටයුතු ආදී සියලුම කටයුතු සඳහා තමාට ශක්තියක් වෙමින් සහාය ලබා දුන් ගරු උප සභාපතිතුමා, ගරු සභික මහත්ම මසහත්මීන් සියලුම දෙනාටත් විශේෂයෙන් ස්තුතිය පුද කරන ලදී.

2023 වර්ෂයේ අයවැය සම්මත කරන ලද අද දින මාගේ පෞද්ගලික මුදලින් අප සභාවට අයත් පෙර පාසල් දරුවන් සහ ගුරුවරුන් සඳහාත්, සියලුම කාර්ය මණ්ඩල නිලධාරීන් ඇතුළු සේවක මහත්ම මහත්මීන් සඳහාත්, ගරු උප සභාපතිතුමා ප්‍රමුඛ ගරු සභිකයින් සඳහාත් දිවා බෝජන සංග්‍රහයක් සූදානම් කර ඇති බැවින්, එම බෝජන සංග්‍රහය භුක්ති විඳින ලෙසට සියලුම දෙනාට ආරාධනා කරන ලදී.

එසේම මෙම දිවා බෝජන සංග්‍රහය පිළියෙල කිරීම සඳහා සහාය ලබා දුන් ප්‍රාදේශීය සභාවේ සේවක මහතුන් වෙත තම ස්තුතිය පුද කරන ලදී.

2023 නව වසර සියලුම දෙනාට සාර්ථක වැඩ කොටසක් කිරීමට හැකි වන රෝ බිය දුරු වන නිදුක් නීරෝගී සාර්ථක සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

අද දින විශේෂ මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපති, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්ට හා මාධ්‍යවේදීන් දෙපල, ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්මියටත්, ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ස්තුතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව. 01.35 ට පමණ මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වාර්තා කළේ - ඩී. රුවිනා දීපානි,
ලේකම්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.



සභාපති,
ඩබ්ලිව්.ජී. උපුල්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2022.12.05 දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී